සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය | සිංහල සාහිත්‍ය රසාස්වාදය | කාලය පැය 03 යි

නම/ විභාග අංකය:

- මෙම ප්‍රශ්න පත්‍රය I පත්‍රය හා II පත්‍රය යන කොටස් දෙකකින් සමන්විත ය.

## I - පත්‍රය

- I පත්‍රයේ ඇති ප්‍රශ්න දෙක සඳහා ප්‍රශ්න පත්‍රයේම උත්තර සපයා වෙනම භාරදෙන්න.

(1) (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''යාන වාහන සරහව. අද දවසේ ම නික්මෙමි.''

(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් ද?

.............................................................................................................

(ආ) ප්‍රකාශ කළේ කාහට ද?

.............................................................................................................

(ii) ''දූන් දූන් ඒ කොල්ලන් ජීවග්‍රහයෙන් අල්වාගෙන එමි''

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

.............................................................................................................

(ආ) එම කොල්ලන් අල්ලා නොගත්තොත් කුමක් සිදුවේ ද?

.............................................................................................................

(iii) ''<u>දියනෙත</u> උදා වන සිය කිරණින් මහරු
<u>මෙදියත</u> දිවා බිහි දුරු වෙයි ගන අඳුරු''

(අ) ඉරි ඇඳි පදවල අරුත් වෙන වෙන ම ලියන්න.

.............................................................................................................

(ආ) සුභාෂිතයෙහි පද්‍ය රචනාකොට ඇති වෘත්ත කුමක් ද?

.............................................................................................................

(iv) ''අපි එන අවුරුද්දේ ඔයිටත් ලොකු කුඩුවක් හදමු''

(අ) මෙය ප්‍රකාශ කළේ කවුරුන් ද?

.....................................................................................................................................

(ආ) මේ හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.

.....................................................................................................................................

(v) ''අපේ රට අපේ ජාතිය අපේ ගම
අපේ අසල් වැසියා යන සියල් ලම

(අ) පද්‍යයේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

.....................................................................................................................................

(ආ) මෙහි පද්‍ය රචකයා නම් කරන්න.

.....................................................................................................................................

(ලකුණු 4 × 5 = 20)

(2) පහත දැක්වෙන ගද්‍ය, පද්‍ය කොටස් දෙකින් එක කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

බුදුහුත් වහන්දෑ කරන කරන කතාව දිව්‍යකනින් අසා වදාරා, භික්ෂූහු නන්දයන් ශාසනයෙහි ඇලුම් කරවා ගත් නියාව අරභයා කතාව කෙරෙති. මම එතෙනට ගියෙම් නම් 'හෙම්බා මහණෙනි, ඒ දූන් මතු නොවන්නේ වේ ද යටගිය දවසත් තෙල ලෙස ම උන්ට ඇති වූ ඇවිටියක් හැරවීම් කියලා ඒ හඟවන්නට ජාතක කතාවක් ගෙන හැර දක්වමි. මාගේ මේ ජාතක දේශනාව පස්වා දහස මුළුල්ලෙහි බොහෝ දෙනට බොහෝ ප්‍රයෝජන සාධා දෙන්නේ ය'යි සිතා වදාරා ධර්ම සභාවට වැඩ සුවිනීතව සුශික්ෂිතව වැඩහුන් පර්ෂ ද බලාපියා ''රන් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රත් නෙලුම් වනයක් සේ මේ භික්ෂු පර්ෂ ද ඉතා හොබිති.... මා එන්නාට පෙරාතු කොට කෙසේ වූ කථාවක් කොට හුණු දැ' යි විචාරා වදාරා මේ කතාව නියාව දූන් වූ කල්හි 'මහණෙනි, ඒ දූන් මතු නොවෙයි වදාරා භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ භස්ම ප්‍රච්ඡන්න ජාත වේදයක් සේ භවයෙන් සැඟ වී තිබූ ඉකුත් වත් කථාව දක්වන සේක්.

(i) මෙම උද්ධෘතයට අනුව භික්ෂූන් කවර කතා බහක යෙදී සිටියේ ද? (ලකුණු 04 යි)

.....................................................................................................................................

(ii) මේවායේ සරල අදහස ලියන්න. (ලකුණු 04 යි)

ඇවිටියක් .................................................. පස්වා දහස ..................................................

සුශික්ෂිතව .................................................. පර්ෂද ..................................................

(iii) ඉහත උද්ධෘතයෙහි සඳහන් උපමාවක් සහ උපමේයය උපුටා දක්වන්න. (ලකුණු 04 යි)

උපමාව ..................................................................................................

උපමේය ..................................................................................................

(iv) 'භස්ම ප්‍රච්ඡන්න ජාත වේදයක් සේ භවයෙන් සැඟ වී තුබූ ඉකුත් වත් කථාව දක්වන සේක්'' යන්නෙහි සරල අදහස දක්වන්න. (ලකුණු 04 යි)

.....................................................................................................................................

.....................................................................................................................................

(v) මෙම උද්ධෘතය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ගෙනහැර දක්වන්න. (ලකුණු 04)

..................................................................................................................................................................

..................................................................................................................................................................

..................................................................................................................................................................

..................................................................................................................................................................

<u>නැතහොත්</u>

පරසිඳු පබු දනන් සෙවි පමණින් මහරු
බෙලෙනිඳු මඳ වුවත් නොකෙරෙති රුපුන් සරු
බරණිඳු ගෙල වසන නා රද වෙමින් ගරු
ගුරුළිඳු අතින් ඇසි කිම යහළු තොරතුරු

අමිත ගුණ නුවණ යුතු උතුමෝ පබඳ
අනත වෙහෙස ලදුවත් නොම වෙති දුහද
දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ
සිඳිත මඬිත එක ලෙස පැතිරෙයි සුවඳ

(i) ඉහත පද්‍යයට අනුව දුබල මිනිසුන් බලයෙන් අඩුවුවත් අහංකාර වීමට හේතුව කුමක් ද? (ල. 04)

..................................................................................................................................................................

..................................................................................................................................................................

(ii) ''නුවණින් යුතු උතුමෝ කරදර හමුවේ දුෂ්ට හිතක් ඇති කර නොගනී.'' එය සමාන කොට දක්වන්නේ කුමකට ද? (ල. 04)

..................................................................................................................................................................

..................................................................................................................................................................

(iii) පරසිඳු <u>පබු දනන්</u> <u>සෙවි පමණින්</u> මහරු'

යන පද්‍යයේ සරල අදහස ලියන්න. ඉරි ඇඳි පදවල අර්ථය ද ලියන්න. (ල. 06)

පබු දනන් .............................................. සෙවි පමණින් ..................................................

..................................................................................................................................................................

(iv) '<u>අමිත</u> ගුණ නුවණ යුතු උතුමෝ <u>පබඳ</u>' යන පද්‍යයේ ඉරි ඇඳි පදවල සහ සමස්ත පද්‍යයේ සරල අදහස ලියන්න. (ල. 06)

අමිත : .......................................................පබඳ : ....................................................................

..................................................................................................................................................................

..................................................................................................................................................................

..................................................................................................................................................................

..................................................................................................................................................................

## II - පත්‍රය

සැලකිය යුතුයි :

- **පළමුවැනි ප්‍රශ්නය ද, 02, 03, 04, 05 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**
- පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න. පිළිතුරක වචන 150 ක් වත් තිබිය යුතුය.

(01) පහත දී ප්‍රකාශයන් කියවා ඒවා උපයෝගී කොට ගනිමින් රසාස්වාදයක් ලියන්න. අවම වචන 200 ක් වත් අවශ්‍ය වේ. (ලකුණු 06X05=30)

(අ) මෙම පැදි පෙළට පාදක වූ අත් දැකීම
(ආ) කවියා යොදා ගත් කාව්‍ය ආකෘතිය
(ඉ) සංකේත භාවිතය සහ ව්‍යංග්‍යාර්ථ භාවිතය
(ඊ) කවියා යොදා ගෙන ඇති භාෂා ශෛලිය
(උ) අත්දැකීමට කවියා යොදාගත් නවතම දෘෂ්ටිය

පෙර ගොරහැඩි රකුසෝ
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොවාගත්ත
කලු රෙදි පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නෙ

කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳට ම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුළු හෙළනවා

ඇස් දෙක මම අරින්නෙ නෑ
තුරුළු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දැහැන ලෝකයට ම

02. වැස්ස පද්‍ය පන්තිය සඳහා කවියා යොදා ගත් භාෂාව අතිශයින් ම උචිත ය. නිදසුන් තුනක්වත් දෙමින් ඉහත කියමන විමසන්න. (ල. 15)

03. දරු සෙනෙහස පිළිබඳ අපූරු සිතුවිලි පෙළක් මැවීමට කතුවරයා සමත් වී ඇති අන්දම 'ඇත් ගාලේ දරු පෙම' පද්‍ය ඇසුරෙන් නිදසුන් තුනක් දෙමින් පැහැදිලි කරන්න. (ල. 15)

04. ඉයෝනා ශෝක වේදනා දරා ගනිමින් ජීවිතයේ යථාර්ථයට මුහුණ දෙන්නට වෙර දරන චරිතයකි. වැලපීම කෙටිකතාවෙන් නිදසුන් තුනක් සපයමින් විවරණය කරන්න. (ල. 15)

05. ග්‍රාමීය මිනිසුන් ආගන්තුක සත්තාරය හොඳින් හඳුනාගත් පිරිසකි. ඒ බව ආගන්තුක සත්තාරය පද්‍ය ඇසුරෙන් නිදසුන් තුනක් දෙමින් විමසන්න. (ල. 15)

## පිළිතුරු පත්‍රය - I කොටස

01 (i) (අ) පබාවතී (ආ) තමන් හා එක්ව ආ අමාත්‍යාන්හට
(ii) (අ) කුස රජු
(ආ) ඒ සත් රජ්ජුරුවන්ට පබාවතිය සත් කඩකට කපා දෙන සේක
(iii) (අ) සූර්යයා, මේ ලෝකයෙහි (ආ) සමුද්‍ර ඝෝෂ විරිත
(iv) (අ) අයියා (වෙසක් පහන කෙටි කතාවේ)
(ආ) තුවාලය වෙලා තිබූ අත මල්ලීගේ හිස මත තබමින් ඔහුගේ හිස පිරිමදිමින් අයියා කළ ප්‍රකාශයයි
(v) (අ) අපේ අතට අවනත කර ගෙන වහම
අපේ ගමට සලකත දිවි දෙමු මෙහෙම
(ආ) එස්. මහින්ද හිමි (ල. 4 x 5 = 20)

02 (i) නන්දයන් ශාසනයෙහි ඇලුම් කරවාගත් නියාව අරහයා (ල. 05)
(ii) කැමැත්තක්, අවුරුදු 5000, මනාව හික්මවන ලද, පිරිස (ල. 05)
(iii) උපමාව : රන් නැවක් මධ්‍ය කො පිපී වැනි ගිය රත් නෙලුම් වනයක් සේ
උපමේය : ඉතා අගනා භික්ෂු පිරිස (ල. 05)
(iv) අළුවලින් වැසීගිය ගිනි පුපුරක් සේ එම ආත්මභවයේ සැඟ වී තිබූ එම පුවත කියා සිටියේ ය. (ල. 05)
(v) භික්ෂූන් නන්දයන් පිළිබඳව කථා බහක යෙදීම
බුදුන් එතැනට වැඩම කිරීම
භික්ෂූන්ගේ ගැටලුව විසඳාලීම සහ ඊට සම්බන්ධ අතීත ආත්ම කථාව ද ගෙනහැර පෑම.
(ලකුණු 04 X 5=20)

<u>නැතහොත්</u>

02. (i) ප්‍රසිද්ධ වූත් පිදිය යුතු වූත් ප්‍රභූ ජනයා ඇසුරු කළ තරමින්
(ii) සුවඳින් යුත් සඳුන් දණ්ඩ කපන විටත්, කුඩු කරන විටත් එක් ලෙස ම සුවඳ පැතිරේ
(iii) ප්‍රභූ ජනයා, ඇසුරු කළ පමණින්
(පද්‍යයේ සරල අදහස සලකා බලන්න.)
(iv) අප්‍රමාණ, ප්‍රසිද්ධ
(පද්‍යයේ සරල අදහස සලකා බලන්න.) (ලකුණු 20)

## II කොටස

01. අරුණෝදයේ ළහිරු රැස් නින්දට බාධා කරන අන්දම නිදහස් පද්‍ය ආකෘතිය
''පෙර දිග ගොරහැඩි රකුසෝ - මගෙ ධ්‍යානය ඇයි කඩන්නෙ''
''නිදා ගන්න පොරොවගත්ත කළු රෙදි පොට
මොකට ද මේ තීරු වලට - ඉරා දමන්නෙ''
සංකේත පද භාවිතය හා ව්‍යංග්‍යාර්ථ රසය ඉස්මතු කොට දැක් වූ අයුරු
නවතම දෘෂ්ටිය - හිරු උදා වෙද්දී ශාක සත්ව ජීවීන් හට අත්වන්නා වූ විපතක් අවහිරයක් උදය
උදයේ සෞන්දර්යාත්මක පැතිකඩ නොදකී.
රසවත් කාව්‍යෝක්ති සහ අපූර්වත්වයෙන් යුතු බස් වහරක් ද යොදා ගෙන ඇත.
''මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුළු හෙළනවා...'' ආදී උදාහරණ (ල. 06 X 05 = 30)

02, 03, 04, 05 උදාහරණ සලකා බලමින් ලකුණු ප්‍රදානය කරන්න. එම විචාර ප්‍රශ්න සඳහා ලකුණු 15 ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| * | එක් උදාහරණයකට ලකුණු 02 බැගින් (02 03) | = | ලකුණු 06 |
| * | එම උදාහරණ විස්තර කිරීමට (02 3) | = | ලකුණු 06 |
| * | භාෂා නිරවද්‍යතාව සඳහා | = | ලකුණු 02 |
| * | නියමිත වචන සංඛ්‍යාව සඳහා | = | ලකුණු 01 |
| * | මුළු ලකුණු | = | ලකුණු 15 |